


**ශ්‍රී. බු. ව. 2558 ක්වූ ඉල් මස කලාපය, රාජ්‍ය වර්ෂ 2014 ක් වූ නොවැම්බර් මස 06 වන දින**

**වැලිගම ශ්‍රී සුගත ශාන්තිසේවා සංසදයේ නිර්මාතෘ ගරු යාවජීව සභාපති**

**ටී. ඩබ්ලිව්. ඒ. කල්‍යාණ වසන්ත මහතා විසිනි.**

**නමො තසස භගවතො අරහතො සමමා සමබුදධසස !!!**

# මහා සාගරයේ ලක්ෂණ තුලින් සම්බුදු සසුන හඳුනා ගනිමු !

**ධම්කාමී පින්වතුනි,**

**අද ඉල්පුර පොහෝ දිනයයි. කිතුවසින් 2014 ක් වූ නොවැම්බර් මසට යෙදුනු පුර පසළොස්වක පෝය දිනයයි. ධම් ස්වාමී වූ ශාන්ති නායක භාග්‍යවත් බුදුපියාණන් වහන්සේ තම සාසනයේ පළමු ධර්ම දූතයන් වහන්සේලාට අවවාද දී පිටත්කර හැරීම, තුන්බෑ ජටිල තාපසවරු දමනය කිරීමට උරුවේලාවට වැඩම කිරීම, අග්‍රශ්‍රාවක සාරිපුත්ත ආයුෂීයන් වහන්සේ පිරිනිවන් පෑම. මෙත් බෝසතුන් විවරණ ලැබීම, පසුවස් පවාරණ දිනය, කඨින පූජා සිදුකරන අවසන් දිනය වීම, අද පොහෝ දිනයේ විශේෂ කාරණා ලෙස දැක්විය හැකිය.**

**අද මෙම දහම් පණිවුඩයට මාතෘකාව වූයේ සූත්‍රපිටකයේ අඟොත් සඟියෙහි මහා වගීයේ පහාරාද සූත්‍රයයි. අපේ සැදැහැවත් ජනතාව විනය සම්පන්න වූ මහා සංඝරත්නය සමග සෑම ගමකම තම හැකි පමණින් බුද්ධ ශාසනයක වටිනාකම දැනගෙන සංඝ විනයකම් හා සම්බන්ධ අති දුර්ලභ කඨින මහා පිංකම් සිදුකරන මේ කාලය තුළ මේ සූත්‍රය ඉගෙන ගැනීමෙන් තව තවත් ඉහත කී වස් කාලය තුළින් සහ කඨින පිංකම තුළින් ඇති කරගත් අසිරිමත් කුසල් වැඩිදියුණු කරගනු නොඅනුමානය.**

භාග්‍යවතුන් වහන්සේ වේරඤ්ජා නගරයේ නලේරු නම්වූ කොහොඹ රුක මුල වැඩ වසද්දී එතනට පහාරාද නම් අසුරේන්ද්‍රයා (දේවතා ගණයෙහි උපදින දෙවියන් මෙන්ම සැප විඳින දේවතා කොට්ඨාශයකි.) පැමිණියේය. භාග්‍යවතුන් වහන්සේට ගරු සරු දක්වා එකත් පසෙක සිටි අසුරයා ඇමතූ භාග්‍යවතුන් වහන්සේ අසුරයින් මුහුදෙහි සිත් අලවා වාසය කරනවාද? යනුවෙන් විමසීය. අසුරේන්ද්‍රයා විසින් උත්තර දෙනව, ස්වාමීනි අසුරයෝ මහා සමුද්‍රයෙහි සිත් ඇලුම් ඇතිව වාසය කරනවා යනුවෙන්. එවිට භාග්‍යවතුන් වහන්සේ පහාරාද, යම්කිසි අසිරිමත් බවක් දකිමින් අසුරයෝ මහා සමුද්‍රය කෙරෙහි සිත් අලවා වාසය කරයි නම් ඒ ආශ්චර්‍ය අද්භූත කාරණා කොපමණදැයි විමසූ සේක. ස්වාමීනි ! යම්බඳු අසිරිමත් බවක් නැවත නැවතත් දකිමින් මහාසමුදුර කෙරෙහි හිත ඇතිව වාසය කිරීමට හේතුවූ සැඟවුන ධර්මතා අටක් මහා සමුද්‍රයෙහි තියනව. මේ ඒ අද්භූත කරුණු අටයි.

1. ස්වාමීනි, මහසයුර අනුපූර්ව නිම්නයි (පිළිවෙලින් ගැඹුරු වූයේ වෙයි.) අනුපූර්ව ප්‍රවණයි. (පිළිවෙලින් නැමුනු ලක්ෂණ ඇත) අනුපූර්ව ප්‍රාග්භාරයි. (සාගර බර පිළිවෙලින් ඉදිරියට බරවී ඇත. මුලදීම ගැඹුරු නොවී පිළිවෙලින් ගැඹුරු ලකෂණ ඇත. ස්වාමීනි, මේ ලකෂණ නැවත නැවත දකිමින් අසුරයෝ මහසාගරය කෙරෙහි සිත් අලවා වාසය කරයිද මේ මහ සයුරේ ප්‍රථම ආශ්චර්‍ය අද්භූත ධර්මය වේ.

2. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස ! තවද පිහිටි ස්වභාවයෙන් යුතු මහ සාගරය වෙරළ නොඉක්මවයි. ඒ නිසා එම දෙවෙනි අසිරිමත් භාවය නිසා අසුරයෝ මහ සාගරය කෙරෙහි සිත් අලවා වාසය කරයි.

3. තවද ස්වාමීනි, මහසාගරය මළකුණු හා සමග වාසය නොකරයි. මහ සාගරයට යම් ආකාරයක මළකුණක් වේ නම් වහාම එය රළ පහරින් ගොඩ නංවයි. එම ලක්ෂණය නැවත නැවත දකිමින් කිසිකලෙක වෙනස් නොවන ඒ ආශ්චර්යමත් අද්භූත වූ ස්වභාවය නිසා අසුරයෝ මහ සයුර කෙරෙහි සිත් අලවා වාසය කරයි.

4. තවද ස්වාමීනි, මහා ගංගාවෝ වෙත්ද එම ගංගාවන් විවිධ නාමයන්ගෙන් යුක්තද (ගංගා, යමුනා, අචිරවතී, සරභූ, මහී) එම ගංගාවෝ මහ සයුරට පැමිණි පසු මුලදී කී නම් හැර එකම සමුද්‍ර නාමයෙන් හඳුන්වයි. එම ලක්ෂණය නොවෙනස්ව නැවත නැවත දකින නිසා අසුරයෝ මහ සාගරයෙහි ඉතා කැමැත්තෙන් සිත් අලවා වාසය කරයි. ඒ මේ සම්බන්ධ හතරවෙනි අසිරිමත් පුදුම එලවන ධර්මතාවයයි.

5. ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, ලෝකයේ යම් කුඩා වුද, විශාල වුද ගංගා මහ මුහුදට වැටේද අහසින්ද වැසි ධාරාවන් කොපමණ වැටේද ඒ හේතුවෙන් කිසි කළෙක මහ සාගරයෙහි අඩු බවක් හෝ වැඩි බවක් නොපෙන්වයි. අන්න ඒ නැවත නැවත දැකිය හැකි ඒ ලක්ෂණය නිසා අසුරයෝ මහ සයුර කෙරෙහි සිත් අලවා වාසය කරයි. මේ පස්වෙනි අසිරිමත් පුදුම සහගත දහමයි.

6. තවද ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස ! මහ සාගරය එකම ලුණු රස ඇත. එම ඒකරස වූ මහසාගරය තුල ඇති එම ස්වභාවය හැම තැනම නැවත නැවත දැකිය හැකිය. ඒ නිසා අසුරයෝ මහ සාගරය අභිරමණය කරති. මේ ඒ හයවෙනි අසිරිමත් පුදුම සහගත දහමයි.

7. ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස මේ මහා සාගරයෙහි නොයෙක් වස්තු ඇත. එනම් මුතු, මිණි, වෙරළුමිණි, සක්, රිදී, රන් ආදියද වේ. එම බහුරත්න ස්වභාව ඇති එම මහ මුහුද තුල ඇති එම ලක්ෂණය නැවත නැවත දක්නට ඇත්ද ඒ නිසා අසුරයෝ මහ මුහුද කෙරෙහි සිත් ආල ඇතිව වාසය කරයි. ඒ හත්වැනි අසිරිමත් අද්භූත ධර්මතාවයයි.

8. ස්වාමීනි, තවද මහමුහුද බොහෝ සත්වයින්ට එනම් විවිධ මත්ස්‍ය ජාතීහුද අසුර, නාග, ගාන්ධර්වයෝය. එම සත්වයෝ විවිධ ආකාර වේ. යොදුන් සියය ආදී වශයෙන් ආත්මභාවයෝ ඇත්තාහ. එසේ විවිධ ආත්මභාව ඇති සත්වයන්ට මහ මුහුද ආවාස වේ නම්, එම ස්වභාවය නැවත නැවත දක්නට ඇති බැවින් අසුරයෝ මහ සයුර කෙරෙහි අභිරමණය හෙවත් සිත් ඇල්මෙන් යුතුව වාසය කරති. එම අටවෙනි ආශ්චර්යමත් අද්භූත ධර්මතාවයයි.

ස්වාමීනි, අසුරයෝ මහමුහුදෙහි යම්කිසිවක් (ස්වභාවයක්) නැවත නැවත දකිමින් මහ මුහුද කෙරෙහි සිත් අලවා අභිරමණය කෙරේ නම් මහා සමුද්‍රයෙහි මේ අෂ්ඨ ආශ්චර්ය අද්භූත ධර්මයෝ වෙතියි. අසුරේන්‍ද්‍රයා කරුණු අටකින් හේතු දැක්විය. එපමණකින් නොනැවතුණු පහාරාද අසුරේන්ද්‍රයා තථාගතයන් වහන්සේගෙන් මෙසේද විමසීය. ස්වාමීනී භාග්‍යවතුන් වහන්ස, භික්ෂූහු මේ ධර්ම විනයෙහි සිත් අලවා වාසය කරන්නේද? යනුවෙනි. පහාරාදය, භික්ෂූන් මේ ධර්ම විනයෙහි සිත් අලවා වෙසෙතියි වදාළහ.

ස්වාමීනි, ඒ සඳහා යම් අසිරිමත් අද්භූත ස්වභාවයක් දිගින් දිගට මේ සාසනය තුළ දැක භික්ෂූන් ඒ නිසා සිත් අලවා ධර්ම විනයෙහි යෙදෙත්නම් එබඳු අසිරිමත් පුදුම සහගත ධර්මයෝ කොපමණක් වෙත්ද? පහාරාදය, එබඳු අෂ්ඨ ආශ්චර්ය අද්භූත ධර්ම ස්වභාවයක් මේ ධර්ම විනය නම්වූ සාසනයෙහි වෙතියි වදාළහ

1. පහාරාදය, මහසයුර පිළිවෙලින් ගැඹුරු වූයේද නැමුනේද ඉදිරියට බරවූයේද මුලදීම ගැඹුරු නොවේද එමෙන්ම මේ ධර්ම විනයෙහි පිළිවෙලින් ඒ අනුව හික්මෙති ඒ අනුව ක්‍රියා පිලිවෙතෙහි යෙදෙති. ඒ අනුව ප්‍රතිපද පුරති යි වදාළහ. එමෙන්ම මුලදීම අරහත්වය ප්‍රතිවේධ නොවේ. සිල්වත් වීම ප්‍රාතිමෝක්ෂ සංවරයෙහි පිහිටීම ආචාරශීලීව අනුමාත්‍ර වරදෙහි භයදැක වාසය කිරීම ඇස, කණ, නාසාදී ඉන්ද්‍රියයන්ට ගෝචර වන නිමිති ගැනීමෙන් අසංවෘත නොවීම සතර සතිපට්ඨානය වැඩීම් ආදී පිළිවෙලකට ශික්ෂාව, ක්‍රියාව, ප්‍රතිපදාව වැඩීමයි. මහසාගරය ක්‍රමයෙන් ගැඹුරු ලක්ෂණ පහළ කරන්නා සේ ධර්ම විනයෙහි අනුක්‍රමයෙන් යෙදී නිර්වාණය සම්පාදනය කරයි. මේ තථාගත ශාසනයෙහි ශ්‍රාවකයන් ධර්මවිනය කෙරෙහි සිත් අලවා වාසය කිරීමේ සසුන පැවැත්වීමේ පළමු ලක්ෂණයයි.

2. පහාරදය යම් විදියක මහ සාගරය පිහිටි ස්වභාව ඇතිව වෙරළ නොඉක්මවාද මාගේ ශ්‍රාවකයන්ට සිකපද පනවන ලද නම් ඒවා ඔවුන්ගේ ජීවිතය නැතිවුවද නොඉක්මවති. එනම් සිකපද කඩනොකරතියි වදාළහ. බුදු සසුන තුළ පැවැත්ම විනය සිකෂාපද ආරක්ෂා කිරීමයි. තම තමන් විසින් තම සිතින් දකිමින් දිවිහිමියෙන් ශික්ෂා පද ආරකෂා කිරීමෙන් ධර්මයෙහි ගුණ නැවත නැවත දකින විට ශාසනය පිළිබඳ අභිරමණයක් ඇලීමක් ඇතිවේ. එය බුදු සසුනේ ලකෂණයයි. මෙය මහ සාගරයේ ලකෂණයක් වන වෙරළ නොඉක්මවීමට සමාන කර සිව් පිරිසම සිකෂාපද නොඉක්මවීම දෙවන අසිරිමත් පුදුමය ලෙසට වදාළහ.

3. පහාරදය, යම් විදියකට මහ මුහුද මළකුණු සමග වාසය නොකරයිද ඒ පරිදි යම්කිසි පුද්ගලයෙක් දුස්සීලව ලාමක ධර්මයන්හි හැසිරේද තිදොරින් අකුසල් කෙරේද එම ගති නිසා ශ්‍රමණ භාවය නැතිකර ගනීද ස්වභාවයෙන්ම සංඝයා ඔහු හා හැසිරීමක් නොවේ. සංඝයා අතර ඔහු සිටියද සංඝ තෙමේ ඔහු කෙරෙන් දුරු වූයේ වෙයි යනුවෙන් වදාළහ. ධර්ම විනයෙහි පිරිසිදු භාවය ධර්ම විනය විසින්ම අරක්ෂා කරනු ඇත. මේ ශාසන ලකෂණය මහ මුහුද තුළද ඇත. මහමුහුද පිරිසිදු කර පාලනය කරන්නෙක් නැත. ශාසනයද ආරක්ෂා වනුයේ විනය තුළිනි. ''විනයො නාම සාසනසස ආයු'' ගිහි සමාජයටද මේ න්‍යායම වනු ඇත. තමන් බෞද්ධයෙකි කියා ගත්තද එය නමින් පමණි. තිදොරින් අකුසල් කරමින් පස්පව් දසඅකුසල් කරයි නම් උන්නත් මළා වගේය. තමන් බෞද්ධ යයි කොපමණ කියා ගත්තත් සාසන චර්යාව තුළ ඔහු නැති බව තම තමන් වටහා ගත යුතුය.

4. පහාරදය, යම් විදියකින් විවිධ නම් ඇති ගංගාවන් මහ මුහුදට පැමිණේ. එසේවත්ම එම නාමය අත්හැරේ. මහ මුහුද යයි කියනා පොදු නාමයම භාවිතා වේ. ඒ පරිදි කෂත්‍රිය, බ්‍රාහ්මණ වෛශ්‍ය, ශුද්‍ර යයි. කුල සතරෙහි පුද්ගලයන් ගිහිගෙයින් නික්ම තථාගත ධර්ම විනයෙහි අනගාරිය පවට පත්වී පළමු නාමගෝත්‍ර හැර ශ්‍රමණ ශාක්‍ය පුත්‍ර යන සංඛ්‍යාවට පත්වේ. ඒ භික්ෂූහු තථාගත ධර්ම විනයෙහි යම් අසිරිමත් බවක් දැක නැවත නැවත දකිමින් මේ ධර්ම විනය අභිරමණය කෙරේ. මේ සිව්වන ආශ්චර්යයයි වදාළහ. ධර්ම විනය තුළ කුල භේද ආදී භේදයක් ක්‍රියාත්මක නොවේ. මුලින් කී අනුපූර්ව ශිකෂා, අනුපූර්ව ක්‍රියා, අනුපූර්ව ප්‍රතිපදාව තුළ පවතින නිර්මල භාවය එයයි. තථාගත ශාසනයක් පැවැත්මට හේතුවන අසිරිමත් කරුණු අතරින් මහා සමුද්‍ර ලකෂණයක් වූ මෙම එකම නාමය සිව් පිරිසටම භාවිතා වේ. භික්ෂු, භික්ෂුණී උපාසක, උපාසිකා යන නාම පොදුවේ භාවිතා වේ. සතර දිගින් මහ මුහුදට එක්වන විවිධ නම් ඇති ගංගාවෝ හා සමාන වේ. මේ සිව් පිරිස ධර්ම විනය නිසිසේ පරිහරණය කරනතාක් ඔවුන්ට මේ ශාසනය ප්‍රිය ස්ථානයකි.

5. පහාරදය, යම් පරිදි ලොවේ මහ ගංගාවෝ මහ සයුරට වැදගනිත්ද වැසිධාරා අහසින් ඇදහැලෙත්ද එයින් මහා සාගරයෙහි අඩුවක් හෝ පිරුණු බවක් නොපෙනේ. ඒ මහා සමුද්‍රයේ ස්වභාවයයි. එලෙසින් බොහෝ භික්ෂූහු අනුපාදිශේෂ නිර්වාණයට පත්වේ. නිර්වාණ ධාතුවේ අඩුවක් හෝ වැඩිවීමක් නොපෙනේ යයි වදාළහ. එසේ නිවනට පත්වීමෙන් එම නිර්වාණ ස්වභාවය තුළ අඩුවැඩිකමක් නොපෙනේ. ශ්‍රාවක සමූහයා ධර්ම විනය කෙරෙහි

සිත් අලවා වාසය කිරීමේ පස්වෙනි අසිරිමත් අද්භූත ධර්මය ලෙසට එම මහසයුරේ ලක්‍ෂණයෙන් සනාථ වේ.

6. පහාරාදය, එකම ලුනු රසින් යුතු මහා සමුද්‍රයේ අසිරිමත් අද්භූත ලක්‍ෂණය සේම මේ එකම රස වූ ධර්ම විනයෙහි එකම විමුක්ති රසයම ඇතිවේ. එම ශ්‍රාවකයෝ යම් අසිරිමත් පුදුම සහගත වූ එම ස්වභාවය නැවත නැවත දකිමින් මේ ශාසනය කෙරෙහි සිත් අලවා අභිරමණය කරති. මේ ධර්ම විනයෙහි සයවෙනි අසිරිමත් අද්භූත ධර්මතාවයයි.

7. පහාරාදය, යම් පරිදි මහා මුහුදෙහි බොහෝ රත්න ජාති, වස්තූන් වෙත්ද ඒ පරිදි මේ ධර්ම විනයෙහි බොහෝ රත්නයෝ වෙති. එනම් සතර සති පට්ඨානය, සතර සම්‍යක් ප්‍රධාන, සතර ඍධි පාද, පඤ්චේන්ද්‍රිය, පංච බල, සතත බොජ්ඣංග, අරිඅටඟිමගය යනාදී වශයෙනි. මේ ධර්ම විනයෙහි ශ්‍රාවකයෝ යම් අසිරිමත් බවක් වූ මේ තත්වය නැවත නැවත දකිමින් මේ සාසනය අභිරමණය කරති. මේ සත්වන අසිරිමත් ධර්මතාවයයි වදාළහ.

8. පහාරාදය, යම් විදියකින් මහ මුහුද විවිධ වූ ශරීර ඇති විවිධ වූ ප්‍රමාණ ඇති විවිධ වූ ආත්ම භාවයෙන් යුතු සත්වයින්ට වාසස්ථානය වේද ඒ පරිදි මේ තථාගත ධර්ම විනය තුල මහත්වූ භූතයන්ගේ (ඒ ඒ තත්වයන්ට පත්වූ ශ්‍රාවක සමූහයා) වාසස්ථානය වේ යැයි වදාළහ. සෝවාන්, සකෘදාගාමී, අනාගාමී, අරිහත් යන සතර මගට පිළිපන් සහ සතර ඵලයට පිළිපන් උතුමන්ගෙන් ශාසනය පිරී ඇති බවයි. ඒ අසිරිමත් බව දකින ශ්‍රාවකයෝ නැවත නැවත ඒ අද්භූත පුදුම සහගත ස්වභාවය හැඳිනීමෙන් ධර්ම විනය ඇලුම් කරයි. තම තම නැණ පමණින් අදත් සිදුවන්නේ ඒ අසිරිමත් බවය. එසේ පහාරාද අසුර රාජයා අමතා මේ ධර්ම විනයෙහි භික්ෂූහු යම් ධර්මතාවයක් දැක මේ ශාසනයෙහි සිත් අලවා වෙසෙත් නම් මේ අට වැදෑරුම් වූ අසිරිමත් අද්භූත (පුදුම සහගත) ධර්මතාවයෝ වෙතියි වදාළහ.

මේ අතිදුර්ලභ මනුෂ්‍ය භාවයතුලින් සූත්‍රයෙන් අප ගත යුතු වන්නේ ඒ දැනුමයි. ඒ දැනුම ලබා නොගතහොත් හඳුනා නොගත හොත් ඒ අසිරිමත් අද්භූත ධර්මය සහ විනය තුල අප සතුටින් සිටින්නේද යන්න වැටහේ. තථාගතයන් වහන්සේ ධර්ම දයාද නම් සූත්‍රයේදී මෙසේ දේශණා කරනවා. ධර්මයට දායාද වෙන්න අධර්මයට දායාද නොවන්න. ඔබ ධර්මයට දායාද නොවී අධර්මයට අවිනයට දායාද වුනොත් ඔබට පමණක් නෙවී ශාස්තෘවූ මටත් මිනිසුන් චෝදනා කරාවි. මේ පහාරාද සූත්‍රයෙන් ද අපිට උන්වහන්සේ පෙන්වා දුන්නේ ශාසනයේ නිර්මලභාවය රැකෙන ආකාරයයි. යම් දවසක සද්ධර්මයේ වේශයෙන් අසද්ධර්මය අවිනය පහළ වුනොත් එදාට ශාසනය අතුරුදහන් වෙන බවද වදාළහ.

මෙවැනි ශාසනයක අධර්මයට ප්‍රිය කෙනෙක් වීම කෙතරම් අභාග්‍යයක්ද.මහා සාගරය උපමා කොට දැක්වූ මේ ශාසනික ලක්ෂණ අදත් අඩු නැතිව පවතිනව. මේ ශාසනයේ කොටස් කරුවන් වන සිව් පිරිසටම මේ සූත්‍රය වැදගත් වෙනව. මහා සංඝ රත්නය අඩුනැතිව අදත් වැඩ ඉන්නව. එය ජීවමාන ආදර්ශයකි. මීට මාසයකට පෙර අවසන් වූ වස්කාලය ද අද අවසන් වන චීවර මාසය තුලදී ද බෞද්ධ ජනතාව මහත් වූ කුසල් සම්පත්

සිදුකරන්නේ මේ සූත්‍රයෙන් ඉගැන්වෙන ඒ ශාසනික ලක්‍ෂණ නැවත නැවත දකිමිනුයි. වස්කාලය සහ චීවර මාසය යනු හුදෙක් කරන්නන් වාලේ කරන සැනකෙළියක් උත්සවයක් නොව, මේ උතුම් ශාසනයේ පැවැත්මේ ඵලය බව අප ගිහි ජනතාව වඩ වඩාත් තේරුම් ගත යුතුය. එවිට අප අතින් අඩුපාඩු සිදු නොවේවි. භික්ෂූන් වහන්සේලා උන්වහන්සේලාගේ උතුම් ගුණ දිවා රෑ සිහි නුවණින් රැක ගනීවි. අපද වෙරළට ගොඩ ගසන මළ කුණක් නොවී සසුන් සාගර පතුලේ මිණි කැටයක් වෙමු යි සූත්‍රයට අනුව සිතා මෙම පුර පෝදින අදිටන් කර ගනිමු.